


# ජාතික ස්වයං-නිර්ණ අයිතිය සහ බහු ජාතික සමාජය

බොහෝ රාජ්‍යයන් සහ දේශපාලන ව්‍යාපාරයන් විසින් ජාතික ස්වයං නිර්ණයට ඇති අයිතිය ඉහලින් ආරක්‍ෂා කරනු ලබන්නේ එම අයිතිය යම්කිසි ජන කොටසකගේ පොදු යහපත සඳහා ක්‍රියාත්මක කල යුතුව තිබෙන අයිතියක් ලෙස සලකා නොව, එම අයිතිය වෙනුවෙන් පෙනී සිටීමෙන් දේශපාලන වාසි සහ වල ප්‍රයෝජන ලබා ගත හැකි බව පෙනී යන්නේ නම් පමණක් බව මීට පෙර පළ කල ලිපි වලින් පෙන්වා දුන්නෙමි. එසේ දේශපාලන වාසි ලබා ගැනීමට නොහැකි වූ බොහෝ විටෙක ඔවුන් එම අයිතිය සපුරා ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත. කෙසේ වෙතත්, ජාතික ස්වයං නිර්ණයට ඇති අයිතිය හිමි විය යුත්තේ කෙබඳු ජන කොටසකටද යන්න තවමත් විසඳී නොමැත.


බ්‍රිතාන්‍යයන්ගෙන් ස්වයං නිර්ණ අයිතය ඉල්ලා සටන් වදින මහත්මා ගාන්ධි

මානව අයිතීන් පිළිබඳ විශ්ව ප්‍රකාශණයෙහි ස්වයං නිර්ණයට ඇති අයිතිය ගැන සඳහන් කර නැතත්, එක්සත් ජාතීන්ගෙ දර්ශනය, ප්‍රඥප්ති සහ ප්‍රකාශණ තුල මෙම අයිතිය ඉතා දැඩි ලෙස මතු කොට තිබෙනු දැකිය හැකිය. සංක්ෂිප්ත ලෙස දැක්වුවහොත් මෙයින් කියැවෙන්නේ ස්වයං නිර්ණයට ඇති අයිතිය සියළු ජනයා සතු අයිතියක් බවයි; මෙම අයිතිය නිසා එම ජනයා තමන්ගේ දේශපාලන තරාතිරම (status) නිදහසේ තීරණය කරන බවයි; එම ජනයා තමන්ගේ ආර්ථික, සමාජමය සහ සංස්කෘතික සංවර්ධනය නිදහසේ ක්‍රියාත්මක කරන බවයි.



ශ්‍රී රිප් ශාර් ගේ කාටූනයක්

එසේ ගත් විට ස්වයං නිර්ණයට ඇති අයිතිය විශ්වයීය අයිතියක් ලෙස සැලකුවත් පවතින රාජ්‍යයන් දක්වන අවංකත්වය විසින් මෙම අයිතිය තුලනයට භාජනය කරනු ලැබේ. රාජ්‍යයක් විසින් දක්වනු ලබන අවංකත්වය මිනිය හැක්කේ කෙසේද? 1993 වියෙනා ප්‍රකාශණයේ දක්වා තිබෙන අන්දමට ඒ සඳහා මිණුම් දණ්ඩ වන්නේ කිසියම් රාජ්‍යයක් තම රටේ වසන ජනයාට කිසිදු ආකාරයක වෙනස්කම් කිරීමෙකින් තොරව ඒ රටේ වසන සියළුම ජනයා නියෝජනය කරන ආකාරයේ ආණ්ඩුවක් ලෙස කටයුතු කරන්නේද යන්නයි.

ජාතික ස්වයං නිර්ණයට ඇති අයිතිය එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් අළුතින් සොයා ගන්නා ලද අයිතියක් නොවේ. එම අයිතියේ ඉතිහාසය ප්‍රංශ විප්ලවය දක්වා දිවෙන අතර, වුඩ්රෝ විල්සන්, ලොයිඩ් ජෝර්ජ්, ව්ලැඩිමීර් ලෙනින්, ලියොන් ට්‍රොට්ස්කි වැනි නායකයින් විසින් එම අයිතිය පලමුවැනි ලෝක යුද්ධ කාලයේදී භාවිතයට නගන ලදී. දහනව වැනි සිය වසේදී 'ජාතිකත්වය පිලිබඳ ප්‍රතිපත්තිය' (Principle of Nationality) යන්නෙන් දර්ශනික වශයෙන් අදහස් කරන ලද්දේ සකලවිධ ස්වෛරීභාවයන් මූලික වශයෙන් රැඳී ඇත්තේ ජාතිය (nation) යන්න තුල බවයි. මෙහිදී එකම භාෂාව කථා කල ජන කොටසක් (race) ජාතියක් (nation) වශයෙන් සලකන ලදී. රාජ්‍යයක් සමන්විත වූයේ එකම භාෂාවක් කථා කල ජන කොටසකින්ය යන්නයි මෙම විශ්වාසයේ පදනම වූයේ.

එසේ වුවත් දහනව වැනි සිය වසේදීම, ජාතිකභාවය (nationhood) පිළිබඳව තිබුණු 'එකම භාෂාව කථා කිරීම' යන නිර්ණායකයට, තවත් නිර්ණායකයන් ගණනාවක් එකතු විය. ඒ අනුව 'ජාතිකත්වය පිලිබඳ ප්‍රතිපත්තිය' පර්ශද සංකල්පයක් බවට පත් විය. ඉතිහාසය, ආර්ථිකය, අනන්‍යතාවය, භූමිය, භාෂාව, සිරිත් විරිත්, සංවේදනා යනාදිය ජාතිය සහ ජනතාව නිර්වචනය කරන නිර්නායකයන් අතරට එක් වූයේ ඒ අනුවය. එක් එක් භාෂා කණ්ඩායමක් සඳහා වෙනම රාජ්‍යයක් හිමි විය යුතුය යන අදහස මේ අනුව වෙනස් වී ගියේය. ඒ සමගම ජාතික ස්වයං නිර්ණයට ඇති අයිතිය පිලිබඳ සංකල්පයද වඩා ප්‍රායෝගික ස්වරූපයක් අත් කර ගත්තේය.

දෙවන ලෝක යුද්ධයෙන් පසු කාලයේ සිදු කෙරුනු යටත් විජිත හරණ (de-colonisation) ක්‍රියාවලියේදී ලෝකය පුරා ජාතික ස්වයං නිර්ණයට ඇති අයිතිය ක්‍රියාවට නැංවීමත්, දැඩි ලෙස ස්ථානගත වීමත් සිදු විය. අධිරාජ්‍යයත් යටත් විජිතයත් අතර ඒකාබද්ධ වුනු දේශපාලන ඒකකයක් නොතිබුනු නිසා මෙන්ම, යටත් විජිත පාලකයාත්, යටත් විජිත වාසීනුත් වෙන් කොට හඳුනා ගැනීම දුෂ්කර නොවූ නිසාද එම ක්‍රියාවලිය තරමක් පහසු වූයේයයි සිතිය හැකිය. එහෙත් අධිරාජ්‍යවාදය විසින් කෘතිම ලෙස බෙදා වෙන් කරන ලද ජන කොටස් පිළිබඳ ප්‍රශ්ණවලට හෝ ඉරි ගසා වෙන් කොට ඇති කරන ලද දේශ සීමා පිළිබඳ ප්‍රශ්ණවලට හෝ එම ක්‍රියාවලියෙන් විසඳුම් ලැබුනේ ඉතාමත් සීමිත වශයෙනි.

මේ නිසා අධිරාජ්‍යවාදීන් විසින් ඇති කරන ලද එක් එක් නව යටත් විජිතයක් තුල ඇතැම් විටෙක විවිධ මානව වර්ගයන්ට අයත් ජන කණ්ඩායම් කිහිපයක් වාසය කරන ස්වභාවයක්ද, තවත් විටෙක එක මානව වර්ගයකට අයත් ජන කොටසක් පමණක් එවැනි නව යටත් විජිතයක් තුල වාසය කරන ස්වභාවයක්ද දක්නට ලැබිණි. තවත් සමහර විටෙක එක් මානව වර්ගයකට පමණක් අයත් ජනයා යාබදව පිහිටි නව යටත් විජිත රටවල් ගණනාවක් තුල වාසය කරන තත්වයක්ද ඇති විය. නව යටත් විජිතවාදී දේශපාලනය තුල ජනතාව බෙදා වෙන් කොට පාලනය කිරීම සඳහා මෙම ස්වභාවයන් මෙවලම් බවට පත් කර ගන්නා ලදී. බොහෝ විට මෙම නව යටත් විජිතවල පාලකයන් බවට පත් කරන ලද්දේ එම යටත් විජිත වල සිටි අධිරාජ්‍ය ගැති සමාජ කණ්ඩායම්ය. එහෙත් මෙම වාතාවරණය තුල එක් මානව වර්ගයකට අයත් ජන කණ්ඩායමක් බොහෝ විට පාලනය කරන ලද්දේ එම මානව වර්ගයට අයත් අධිරාජ්‍ය ගැති සමාජ


ස්වයං නිර්ණ අයිතිය උදෙසා උද්ගොෂණය කරණ ඉරාක ජාතිකයෝ

කණ්ඩායමක් විසින්ම නොවේ.

මේ අනුව ගත් විට නව යටත් විජිත රාජ්‍යය සමන්විත වූයේ එකම භාෂාවක් කථා කල ජන කොටසකින් හෝ එකම මානව වර්ගයකට අයත් ජන කොටසකින් නොවේ. නව යටත් විජිත රාජ්‍යයන් තුල බහු ජාතික රාජ්‍ය නිර්මාණය වී ඇත්තේ ඒ අන්දමටය. විවිධ ජන කොටස් අතර සාමකාමී සහපැවැත්මට බලවත් ලෙස තර්ජන එල්ල කරමින් බහු ජාතික රාජ්‍යයන් තුල බරපතල අර්බුද පැන නැගී ඇත්තේ මේ නිසාය. එක් එක් රටේ පවතින විශේෂිත වාතාවරණයන් මතයි, එවැනි ප්‍රශ්ණ, ගැටළු හා දුෂ්කරතා පැන නැගී ඇත්තේ. මෙවැනි තත්වයන්ට ඒ ඒ රටේ පවතින සුවිශේෂ ඓතිහාසික සම්ප්‍රදායයන්, දුක් ගැනවිලි, සමාජ අසාධාරණ, ඇති නැති පරතර, ධ්‍රැවීකරණය වූ දේශපාලන පද්ධති සහ සංධාන, වෛර සහගත දේශපාලන සංස්කෘති, ස්වීකරණ වාදී දේශපාලන ප්‍රතිපත්ති, අප්‍රමාණවත් හෝ නිර්-ප්‍රජාතන්ත්‍ර වාදී ව්‍යවස්ථා හෝ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ යනාදී කරුණු පාදක වී තිබේ. ඒ නිසාම, ජාතිකවාදය නමැති දේශපාලන ප්‍රතිපත්තිය, එනම්, දේශපාලන ඒකකය සහ ජාතික ඒකකය සර්වාකාරී ලෙස අංගසම විය යුතුය යන්න එවැනි නව යටත් විජිත රාජ්‍යයක් තුල තව දුරටත් වලංගු වන්නේ නැත.

ජාතික ස්වයං නිර්ණයට ඇති අයිතිය විශ්වයීය අයිතියක් ලෙස සැලකුවත් එම අයිතිය හිමි විය යුත්තේ කෙබඳු ජන කොටසකටද යන ප්‍රශ්ණය මෙයින් තවත් සංකීර්ණ බවට පත් වී තිබේ. ගෝලීයකරණ ක්‍රියාවලිය තුල දැනට සිදු වෙමින් පවතින ජන සංක්‍රමණය විසින් මෙම අයිතිය හිමි විය යුත්තේ කුමන ජන කණ්ඩායම් වලටද යන ප්‍රශ්ණය තව තවත් සංකීර්ණ එකක් බවට පත් කර සිටිමින් ඇත. මේ නිසා ජාතික ස්වයං නිර්ණයට ඇති අයිතිය පිළි ගන්නා පදනමක් මත, එහෙත් එම අයිතිය සෛද්ධාන්තික ලෙසකින්ම යොදන්නට උත්සාහ නොකොට, ඒ වෙනුවට එක් එක් විශේෂිත වාතාවරණයක් විසින් කරලියට ගෙනැවිත් තිබෙන නිශ්චිත තත්වයන්ට අනුකූල වන අන්දමට නිර්මාණාත්මක ලෙස විසඳුම් සොයා ගැනීමට උත්සාහ කිරීම දේශපාලන අත්‍යවශ්‍යතාවයක් බවට පත් වී තිබේ.

ඉදිරි කලාපයට →

ලයනල් බෝපගේ

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243